සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

නම / විභාග අංකය :-........................................................... කාලය: පැය 02 යි

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ධර්මය තම ගුරුවරයා ලෙස තබාගැනීමට බුදුන් වහන්සේ තීරණය කළේ බුදු වීමෙන්,

(1) පළමු සතියේ දී ය. (2) තෙවන සතියේ දී ය.
(3) පස්වන සතියේ දී ය. (4) සත්වන සතියේ දී ය.

(2) බුදු සසුනේ බුදුන් හා දහම් සරණ ගිය ප්‍රථම උපාසකවරු වන්නේ,

(1) උපතිස්ස කෝලිත පිරිවැජියන් ය. (2) තපස්සු භල්ලුක සහෝදරයන් ය
(3) චූලෝදර මහෝදර නාරජුන් ය. (4) තුන් බෑ ජටිලයන් ය.

(3) පස්වග තවුසන් රහත් භාවයට පත් වූ සූත්‍රය වන්නේ,

(1) අනත්ත ලක්ඛන සූත්‍රය. (2) දම්සක් පැවතුම් සූත්‍රය.
(3) ආදිත්ත පරියාය සූත්‍රය. (4) දේවදූත සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ අපේ රටේ මහියංගනයට වැඩම කළේ,

(1) වෙසක් පෝය දා ය. (2) බක් මස අමාවක පෝය දා ය.
(3) දුරුතු පෝය දා ය. (4) පොසොන් පෝය දා ය.

(5) බුදු සසුනේ ප්‍රථම වරට පූජා කළ ආරාමය,

(1) නිග්‍රෝධාරාමය. (2) වේළුවනාරාමය.
(3) ජේතවනාරාමය. (4) වාලුකාරාමය

(6) බුදුරජාණන් වහන්සේ පිළිබඳව විශාල ගෞරවයක් පැහැදීමක් සිත් තුළ උපදවා ගැනීමට උපකාර වන භාවනාව වනුයේ,

(1) ධම්මානුස්සති භාවනාව (2) සීලානුස්සති භාවනාව
(3) බුද්ධානුස්සති භාවනාව (4) සංඝානුස්සති භාවනාව

(7) ත්‍රිවිධ චෛත්‍යය පිළිවෙලින් වන්දනා කිරීම සැදැහැවත් බෞද්ධයකු ගේ ලක්ෂණයකි. මෙහි ත්‍රිවිධ චෛත්‍යයට අයත් වන කරුණ වන්නේ,

(1) පිළිම වහන්සේය (2) මහා පිරුවානා පොත් වහන්සේ ය.
(3) පන්සිය පනස් ජාතක පොත් වහන්සේය (4) දළදා වහන්සේ ය.

(8) සියලු සත්ත්වයන්ට කරුණාව මෛත්‍රිය වැඩිය යුතු ආකාරය දැක්වෙන සූත්‍රය,

(1) පරාභව සූත්‍රය (2) මහා මංගල සූත්‍රය
(3) කරණීය මෙත්ත සූත්‍රය (4) වසල සූත්‍රය

(9) අනේපිඬු සිටුතුමා කහවනු පනස් හතර කෝටියක් වියදම් කර ගොඩනැගූ විහාරය වන්නේ,

(1) ජේතවනාරාමය (2) පූර්වාරාමය
(3) වේළුවනාරාමය (4) වාලුකාරාමය



LIVEWORKSHEETS

(10) ගාථා 423 වග්ග 26 ක් ඇතුළත් බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන ධම්මපදය නම් ග්‍රන්ථය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

(1) ඛුද්දක නිකායට ය. (2) සංයුක්ත නිකාය ට ය.
(3) අංගුත්තර නිකායට ය. (4) දීඝ නිකායට ය.

(11) සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ඇතුළත් "සිරිත් මල් දම" පොතෙහි කතුවරයා වන්නේ,

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය. (2) එස් මහින්ද හිමි ය.
(3) වීදාගම මහා මෛත්‍රී හිමි ය. (4) ඇල් ඇම් සිල්වා ගුරු මුහන් දිරම් කුමා ය.

(12) ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය වන්නේ,

(1) පංච සීලයයි. (2) උපසම්පදා සීලයයි.
(3) ආජීව අෂ්ටමක සීලයයි. (4) දස සීලයයි.

(13) නිර්වාණගාමී මගට පිවිසීමේදී අත්‍යවශ්‍ය වන ධර්ම සමූහය බුද්ධකාරක ධර්ම ලෙස හඳුන්වයි. එම ධර්ම කරුණු,

(1) දස පාරමිතා ලෙස හඳුන්වයි. (2) දස පුණ්‍ය ක්‍රියා ලෙස හඳුන්වයි.
(3) දස රාජධර්ම ලෙස හඳුන්වයි. (4) දස කුසල් ලෙස හඳුන්වයි.

(14) හිවලා සහ පවුලේ සැමට තම වාසස්ථානය අසලම නවාතැන් දුන් සිංහයකු ගැන කියවෙන ජාතක කතාව වන්නේ,

(1) වට්ටක ජාතකය (2) සේරිවාණිජ ජාතකය
(3) තිත්තිර ජාතකය (4) ගුණ ජාතකය

(15) බුද්ධ කාලීන භාරතයේ විසූ ඇතැම් ශාස්තෘවරුන් දේශනාකර ඇත්තේ "සියල්ල සිදුවන්නේ සර්වබලධාරී දෙවියකුගේ මැවීම අනුව බවයි" මේ අදහස,

(1) ඊශ්වර නිර්මාණවාදය නම් වේ. (2) අමරාවික්ඛේපවාදය නම් වේ.
(3) අකිරියවාදය නම් වේ. (4) උච්ඡේදවාදය නම් වේ.

(16) ගිරිමානන්ද සූත්‍රය අනුව රෝග හට ගන්නා ක්‍රමයක් වන "සන්නිපාතිකා ආබාධා" යනු,

(1) පිත කිපීමෙන් හටගන්නා ආබාධයන් ය. (2) ඍතුවිපර්යාස නිසා හටගන්නා ආබාධයන් ය.
(3) අනුන්ගෙන් බෝ වීම නිසා හටගන්නා ආබාධයන් ය (4) කර්ම විපාක නිසා හටගන්නා ආබාධයන් ය.

(17) බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය පිළිබඳ ප්‍රථමයෙන්ම කරුණු ගෙනහැර දැක් වූ සූත්‍රය වන්නේ,

(1) දම්සක් පැවතුම් සූත්‍රය (2) රතන සූත්‍රය
(3) අනත්ත ලක්ඛන සූත්‍රය (4) කුල සූත්‍රය

(18) කායානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා හා ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨාන භාවනාව වැඩීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අයත් වන මාර්ග අංගය වන්නේ,

(1) සම්මා දිට්ඨි (2) සම්මා සමාධි
(3) සම්මා සති (4) සම්මා සංකප්ප.

(19) මාතලේ අලුවිහාරයේ දී පැවැත්වූයේ,

(1) පළමු ධර්ම සංගායනාවයි (2) සිව්වන ධර්ම සංගායනාවයි.
(3) දෙවන ධර්ම සංගායනාවයි (4) තුන්වන ධර්ම සංගායනාවයි

(20) කුඹුරුවලින් අස්වනු ලබා ගැනීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම.

(1) අග්‍රශස්‍ය දානය යි. (2) මී පිඬු දානයයි.
(3) සාංඝික දානයයි. (4) සලාක දානය යි.

(ලකුණු 02 x 20 = 40)



LIVEWORKSHEETS